# කෙටිකතා අතිරේකය

## හන්තානේ පැවූ ඇසළ පුරහඳ

THE SINHALA
July 2014
The SINHALESE CULTURAL
FORUM OF NSW

මහාචාර්ය පෙල්ටන් පීරිස්

'අම්මෙ අපි යමුද මේ සැරේ නුවර පෙරහැර බලන්න' රංග සිය කුඩා නැගෙනියගේ සුරතල් බලමින් සිටි මවගෙන් ඇහුවා.

'අනේ මගෙ පුතේ නංගි තාම පොඩියිනේ. එයා ටිකක් ලොකු උනාම යමු'

'අනේ අම්මෙ චන්නලත් යනවා කිව්ව. ධම්මි ආන්ටි කිව්වා අපට එයාලගෙ වෑන් එකෙන්ම යන්න පුළුවන් කියලා.' රංගගේ ඇස්වල කඳුලු පිරිලා.

'පුතාගෙ ආසාවනේ රමණී. එයා කැමති කාලෙ ගියාම ඒක හොඳට මතක හිටීවි. අනික එයාට පේරාදෙණිය මල්වත්තත්, විශ්ව විද්‍යාලයත් පෙන්නන්න පුලුවන්නේ' ජයදාස එසේ කීවේ තම පේරාදෙණි අතීතය සිහිකරමින්.

දැනට කොළඹ මහ රෝහලේ හෘද රෝග විශේෂඥයෙක් ලෙස සේවය කරන ජයදාසට පේරාදෙණියේදී ගත කළ සැහැල්ලු දිවිය සිතුවමක් ලෙස මැවී පෙනෙන්නට විය.

'ඔයා නම් ඒ කාලෙ නිතරම පෙරහැර බලන්න ඇති නේද ජයේ?'

'ඔව් අපි පෙරහැර බලන්න කියල නුවර යනව නම් තමයි. ඒත් වැව වටේ කරකැවිල, බෝගම්බර කානිවල් එක බලල රෑට හෝල් එකට ඇවිත් නිදා ගන්නවා. ඒක තමයි පෙරහැර බැලිල්ල' දෙදෙනාටම හිනා.

'එහෙනම් මේ සැරේවත් හොඳට පෙරහැර බලමු' රමණී විහිලුවක් කළා.

★ ★ ★

'රමණී. මට ඔයාට කියන්න බැරි උනා. ඩොක්ටර් විජේසිංහ කීවා එයාගෙ ඩී.එම්.ඕ. බංගලාවෙ අපි ඔක්කෝටම ඉන්න පුලුවන් කියල. එයා රැජිණ හෝටලේ ගාව තැනක් සූදානම් කරලා අපට පෙරහැර බලන්න.'

'අනේ හොඳයි. ඒත් මට මේ කෙල්ල ගැන තමයි දුක. තාම පොඩි එකීනෙ' අම්මා ගමනට අවශ්‍ය ඇඳුම් පැළඳුම් බෑගයට අසුරණ ගමන් නංගිව ඉඹියි. අම්මා සියල්ල සූදානම් කරන දෙස රංග බලාසිටියේ හරිම ආසාවෙන්.

'එහෙනම් පුතේ දැන් ගිහිල්ල නිදාගන්න. රෑ එකොලහටත් කිට්ටුනේ. හෙට උදෙන්ම නැගිටින්න. චන්නල උදේ අටට මෙහාට එනව කිව්ව.'

පළමු දින හොඳින් පෙරහැර නැරඹූ හැම දෙන දෙවන දිනයේ පේරාදෙණි මල්වත්ත නැරඹීමට ගියා. චන්න එල්ලෙන පාලම දිහා බයෙන් වගේ බලාගෙන ඉන්න හැටි රංග දැක්කා.

'චන්න අපි යමුද අර හෙල්ලෙන පාලම දිගේ' රංග ඇහුවා.

'අනේ මට නම් හරිම බයයි රංග ඔයා යන්න'

'බය වෙන්න එපා චන්න. මගේ අත අල්ලගන්න වැටුනොත් මම ඔයාවත් ඇදගෙන එනවා.' රංග වීරයෙක් වෙයි.

රමණියි ධම්මියි මල් ගස්වලට වශී වෙලා වගේ බලාගෙන ඉන්නවා.

'ධම්මි බලන්නකො මේ ඕකිඩ්ස් වල ලස්සන? ජයේ අපි දෙන්නව මෙතන තියල පොටෝ එකක් ගන්නකො.' ඒ ඡායාරූපයත් අතීත සිහිවටන අතරට එකතු වුණා.

'දැන් නම් වෙලාව දවල් එකටත් ළඟයි අපි කැම්පස් එකටම ගිහිල්ල ලන්ච් ගනිමු. ඒ ගමන් කැම්පස් එකත් පුතාලට පෙන්නන්න පුලුවන්නේ' ජයදාස කිව්වා. 'රංග... චන්න... පුතාලා මෙහෙ එන්න. අර.. අර පේන්නෙ හන්තාන කඳු වැටිය. මේ පැත්තෙන් මහවැලි ගඟ. බලන්න කොච්චර ලස්සනද? පුතාලත් ලොකු උනාම මෙහාටම එන්න ඕන හොඳද?' පරිසරයට ආකර්ෂණය වී සිටි රංගට එය නොඇසුනි.

* * *

රෑ කෑමෙන් පස්සේ කවුරුත් පෙරහැර බලන්න එකතු වුණා.

'අද අන්තිම දවස නිසා සෙනග හරිම වැඩියි. මේ ළමයි තුන්දෙනාව හොඳට බලාගන්න' තිලක් අන්කල් කීවේ සෙනග අතරින් වටපිට බලමින්.

'අන්න අන්න රංග බලන්න බලන්න ගිනි බෝල කාරයො එනවා' චන්න උඩ පනිමින් කියනවා.

'අනේ හරිම ලස්සනයි. නංගි ඔයාට පේනවද?' රංග නංගිගෙන් ඇහුවා. නංගී ඔලුව වනයි.

'පුතාලා අර බලන්න ඇත් රාජයා එනවා දන්ත ධාතුන් වහන්සේගේ කරඬුවත් එක්ක සාදු සාදු කියන්න.' හදිසියේම මිනිස්සු කෑකෝ ගසමින් දුවන්නට වූහ. පොලිසියද කලබලයෙන් මිනිසුන් හසුරුවයි.

'ඇයි ඇයි මොකද?'

'දුවන්න දුවන්න. අලියෙක් කුලප්පු වෙලා. උඹ මේ පැත්තට එනවා'.

ගුලක ඇවිස්සූ කඩියන් ලෙස මිනිස්සු හිස් ලූ ලූ අත දුවති. අපි බිත්තියට අයින් වීමු.

'පුතේ පුතේ කෝ නංගි?' රමණී කලබලවෙලා ඇහුවා.

'මා ළඟ නැහැ. තාත්ත ළඟයි හිටියෙ'

'අනේ ජයේ ඉක්මණට බලන්න මේ ළඟම ඇති.' අම්මාට සිහි නැතිවිය. වතුර බීමෙන් සිහිලත් අම්මා විලාප දෙන්නට විය. ධම්මි නැන්දා ඇය සනසයි.

'ඔයාල මෙතනම ඉන්න මම අර පැත්තට යන්නම්. තිලක් මාලිගාව පැත්තට ගිහින් බලන්න'



පැය බාගයකින් පමණ තාත්තාත් තිලක් මාමාත් ආවේ හිස් අතින්. අම්මා නැවතත් සිහිසුන්ව ඇද වැටුනි. ටික වේලාවකින් සිහිලත් අම්මා මාලිගය දෙසට වැඳ වැටෙමින් 'අනේ දළදා හාමුදුරුවනේ අපිට මේ මොකද උනේ? මගේ මේ නොදරුවාව සොයා දෙන්න' යැයි විලාප දෙන්නට විය.

තාත්තාගේ විස්තර ඇසූ විජේසිංහ මාමා ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරීවරයා සමග විගස ආවේය.

'ඩොක්ටර් ජයදාස මම මේක අහපු ගමන්ම අවට පොලීසි වලටයි පෙරහැරේ සේවය කරන සියලුම නිලධාරීන්ටයි දැනුම් දුන්නා. අපි දැන් පොලීසියට ගිහිල්ල ටිකත් ඉඳිමු. විස්තර ලැබුණ ගමන්ම මට දන්වාවි'

පොලිස් අධිකාරීවරයාගේ කාරුණික වදන් ඇසූ හැම ඔහු සමග පොලිස් ස්ථානයට ගියා. කිසිම ආරංචියක් නැහැ. පසුදින එළිවන තුරු පොලිසියේ රැඳී සිට හැම ඔවුන් නැවතී සිටි ඩී.එම්.ඕ. බංගලාවට ගියේ හැඬූ කඳුලිනි.

තවත් දවස් තුනක් ඔවුන් ගත කළේ නංගී ගැන හෝඩුවාවක් ලැබේදෝයි සිතමින්. අම්මා නම් ඒ දිනවල කිසිම කෑමක් බීමක් ගත්තේ නැහැ.

'අනේ අම්මෙ මට සමාවෙන්න. මම තමයි නුවර පෙරහැර බලන්න යමුයි කියල කීවේ. මම කවද හරි නංගිව හොයා ගන්නව' රංග කීවේ අම්මා සැනසීමට පමණක් නොව දැඩි අධිෂ්ඨානයකින්.

'අනේ මගේ රත්තරන් පුතේ. ඔයා මොනව කරන්නද? මේ අපි ලබා උපන් හැටි තමයි.' අම්මා නැවත ඉකි බිඳියි.

'රමණී අපි දැන් කොළඹ යමු. දුව ගැන ආරංචියක් ලැබුණ ගමන්ම Dr විජේසිංහ මගින් ASP බණ්ඩාර අපිට දන්වාවි'

අම්මා අදිමදි කළත් දැනට කළ යුත්තේ එය බව තීරණය විය.
'එහෙනම් ජයේ අපි දළදා හාමුදුරුවන්ට බාරයක් වෙලාම යමු, අපේ දුවව ඉක්මණටම ලබා දෙන්න කියල'

* * *

පොඩි නංගි ලැබීමෙන් පසු අම්මා තරමක් සන්සුන් වුවත් ලොකු නංගිගේ පිළිරුව දකින හැම විටකදීම හඬා වැලපෙයි. ඉන්පසු කිසි දිනක රංග නුවර පෙරහැර ගැන කතා කළේ නැත. ලොකු නංගි හිටියා නම් දැන් අවුරුදු 14-15 ඇති. රංගට දිග සුසුමක් හෙලුනි.

* * *

'කන්ග්‍රැජුලේෂන්ස් රංග පුතාවයි චන්න පුතාවයි දෙන්නට පේරාදෙණියට තේරිලා' ධම්මි නැන්දාගෙන් සුභ පැතුම.

'අනේ අම්මා මම කොළඹට මාරුවක් හදා ගන්නම්. නැත්නම් නුවර යන හැම වෙලාවටම මට නංගිව මතක් වෙලා හැඬේවි.' රංග කිව්වා.

'පුතේ මේ වාසනාව අත් හරින එක හොඳ නැහැ. තාත්තත් හරිම ආසාවෙන් ඉන්නෙ පුතා පේරාදෙණි යනව දකින්න අනික නංගිව එහේදි මුණ ගැහෙන්නත් පුලුවන්' අම්මා බලාපොරොත්තු ඇති කරයි.

'පුතේ අපේ අර ලොකු හාමුදුරුවො නංගිගෙ හඳහන බලල කීවෙ එයා කොහේ හරි යහතින් ඉන්න ඕන. මේ අපල කාලය මග හැරුනාම ඉබේටම මුණ ගැසේවි කියල. අපි හැම බදාදාවකටම බෝධි පූජා පවත්වන්නෙ අපල ඉක්මණට දුරු වෙන්න කියල'.

එදා පේරාදෙණි යන දවසේ අම්මා දුන් පඬුර දළදා වහන්සේ ඉදිරියේ තබා රංග භාර උනේ පේරාදෙණියෙන් පිටවී යාමට පෙර නංගීව ලබාදෙන ලෙස ඉල්ලමින්. පසුගිය අවුරුදු හතරකට ආසන්න කාලයේ හැම බදාදාවකම දළදා මාලිගයට යන රංග වැඳ පුදා එම බාරය නැවත සිහිකරයි.

* * *

රංග දැන් අවසාන වසරේ ආර්ථික විද්‍යාව විශේෂ උපාධි විභාගය සඳහා සූදානම් වෙයි. විභාගයට ඇත්තේ තව මාස තුනක් විතර. එදාත් බදාදා දවසක්. සිකුරාදා ඇසල පෝය නිසා නිවාඩු. දේශණ අවසන් වූ රංග කලාගාරය ඉදිරිපස බස් නැවතුමේ සිටියේ දළදා සමිඳුන් වැඳ බාරය සිහිකිරීමට. නවකයන් පැමිණ ඇති මේ දිනවල සරසවිය ඉතාමත් කළබල කාරීය. මාර්ෂල් හා විනය පරිපාලක ආචාර්ය වරුන් නිතර එහා මෙහා යමින් නවකයන් ගැන සොයා බලයි.

'අනේ අයියේ මේ ජ්‍යෝෂ්ඨයන් රැලක් මගේ පස්සෙන් පන්නනවා මට වද දෙන්න. අය්යේ මාව මෙයාලගෙන් බේරගෙන හෝල් එකට ගිහින් බස්සන්න'

කව්දෝ ගැහුණු ළමයෙක් රංග ළඟ. රංග තිගැස්සුනා. රංග ළඟට පැමිණි ජ්‍යෝෂ්ඨ කණ්ඩායමේ සිටි සැල් ගුණයා 'නංගි අද මේ රංග හිටි නිසා බේරුනා. ඒත් පස්සෙ හමුවෙමුකො' කිව්වා. ඇය බියවී බලා සිටියා.

ඇගේ බියපත් දෙනෙත් දැක්කාම රංගට අනුකම්පාවක් ඇති වුණා. ඉල්ලන ඕනම උදව්වක් කරන්න කියලත් හිතුනා.

'ඔයාට කොහාටද යන්න ඕන නංගී'

'රාමනාදන් එකට'

'එහෙනම් යමු නංගි. හෙට උදේටත් මම එන්නම් ඔයාව එක්කගෙන යන්න. මං මගේ යාලුවන්ටත් කියන්නම් ඔයා මගේ නංගි, ඔයාව හොඳට බලාගන්න කියලා' රංගට දැනුනේ අමුතුම ලෙන්ගතු කමක්.

'බොහොම ස්තුතියි අයියේ.' කියලා එයා මඳ දුරක් රංගත් එක්ක ආවා.

'ඔයා මොනවද ස්ටඩි කරන්නෙ?'

'මම ඉකොනොමික්ස් ස්පෙෂල් මේ මගේ අන්තිම අවුරුද්ද.' රංග පිළිතුරු දුන්නා.

'නංගි මොනවද කරන්නෙ?'

'ජියෝග්‍රපි, ඉකොනොමික්ස්, සයිකොලොජි. මාත් ආසයි ඉකොනොමික්ස් වලට'

අතර මගදී හමු වූ කපුටු පියා 'එහෙනම් උඹට අදම හරි ගියා රංග' කියා විහිළුවක් කර ඔවුන් පසුකර ගියා.

'මොකක්ද නංගි ඔයාගේ නම?'

'නයනා විශ්වකාන්ති වර්ණකුලසූරිය.'

'ෂා! හරිම ලස්සන නමක්නේ'

'අයියාගෙ නම?'

'රංගසිරි ධර්මබන්ධු'

'අය්යටම හරියන නමක්'

'නංගි දැන් වෙලාව කීයද?'

නයනා වෙලාව බැලීමට අත කරකවද්දී වම් අතේ සුලැඟිල්ලේ තිබුන දිග උපන් ලපය රංග දැක්කා.

'නංගි මට ඔයාගේ වම් අත ආයෙත් ටිකකට පෙන්වනවද?'

'ඇයි අයියේ?'

'අර ඔයාගේ සුළැඟිල්ලෙ තියෙන උපන් ලපය බලන්න' රංගට කතා නැති විය. දෑසට ඉබේම කඳුලු ඉනුවේ අම්මා පේරාදෙණි එනවිට කිවූ කතාව සිහිවීමෙන්.

'පුතේ නංගිගෙ වම් අතේ සුලැඟිල්ලෙ දිග උපන් ලපයක් තියෙනව ඒකෙන් නංගිව අඳුන ගන්න පුලුවන් වේවි'

'ඇයි අයියේ ඔයාගේ ඇස් වල කඳුළු?'

'මට ලොකු නංගිව මතක් වුණා. එයාගෙ සුලැඟිල්ලෙත් ඔය වගේම උපන් ලපයක් තිබුණා'

'ඉතිං අයියේ ඒ නංගිට මොකද උනේ?'

රංග සියලු විස්තර කීවේ දුකෙන්.

'අපේ අම්මිත් මට ඔය වගේ කතාවක් කියල තියෙනව. පොඩි කාලේ මාව ලැබුණේ පෙරහැර බලද්දි දළදා හාමුදුරුවන්ගේ පිහිටෙන් කියලා' නයනා කීවේ හැඬුම් බරව.

'එහෙනම් ඔයා මගේම නංගි'

සතුටු කඳුලු අතරින් රංග නයනා දෙස බලා සිටියේ විශ්මයෙන්

'මම හැම බදාදාවකම දළදා මාලිගාව වැඳල ඉල්ලනව ඔයාව ඉක්මණට ලබාදෙන්න කියල. අදත් යන්න හිටියේ ඒකට තමයි. එහෙනම් ඒක ඒ විදියටම සිද්ධ වුනා'

'මේක කොච්චර ආශ්චර්යයක්ද දෙවියනේ'

අද අපි දෙන්නම ගිහිල්ල දළදා වඳිමු. මේ සිකුරාදා දළදා පෙරහැර බලන්නත් යමු. මේ සැරේ නම් ඔයාව නැතිවෙන එකක් නැහැ.' දෙදෙනාම සිනාසුනේ හරිම සැහැල්ලුවෙන් සතුටින් සතුටු කඳුලු බේරෙනව.

'නංගි මම දැන්මම අම්මට කෝල් කරල කියන්නම් මට ඔයාව හමු උනා දැන් මගේ ළඟම ඉන්නව කියල. අම්ම නං හරිම සතුටු වේවි.'

'අනේ මගේ රත්තරන් දුවේ උඹ නැතිව මම කොච්චර ඇඬුවද? දළදා හාමුදුරුවන්ට පිං සිද්ධ වෙන්න, මගේ පුතාට බුදුබව ලැබෙන්න මට ආයෙත් උඹේ කටහඬ අහන්න වාසනාව ලැබුණා' නයනාගේ කට හඬ ඇසුණ සැනින් අම්මා කිව්වා.

'අපි හෙටම දුව බලන්න කුරුණෑගලට දුවගෙ ගෙදරට එනවා' කියලා රමණී ඊට පස්සෙ කිව්වෙ කිසිම ඉස්පාසුවක් නැතුව.

පසු දින රංගත්, විශ්ව කාන්තිත් කුරුණෑගල යන විට අම්මා, තාත්තා, ධම්මි නැන්දා හා තිලක් මාමා ඇවිත් සිටියා. නංගි ගොස් සියලු වැඩිහිටියන්ට වැන්දේ හරිම භක්තියෙන්.

'මගේ කෙලීව ඇස් දෙක වගේ බලාගෙන හොඳට ඉගැන්නුවට ලලිතා නංගිත් ධනපාල මල්ලිත් මතු බුදු වෙන්න ඕන.' රමණී කිව්වා. 'මගේ හිතට දැන් හරිම සැනසීමක්. දුව මේ අම්මත් එක්කම ඉන්න'

'අනේ රමණී අක්කෙ අපිටත් වෙන දරුවෙක් මල්ලෙක් ඉන්න එකක් යැයි. අපේ මේ දේපොල ඔක්කොම මේ දුවට තමයි' ලලිතා නැන්දා කීවෙ හැඟුම් බරව. ධනපාල මාමගේ ඇස්වල කඳුලු.

සිකුරාදා හැම දෙන දළදා සමිඳුන් වැඳ නුවර පෙරහැර බැලුවේ ජීවිතය කියන්නෙ කොච්චර ලස්සන සිතුවම් පටක්ද කියල සිතමින්.

නුවර වැවට උඩින් ඇසල සඳ පායල. අද නුවර කොච්චර ලස්සනද? රංග, නයනාගේ අත අල්ලාගෙන සිටියේ හරිම සෙනෙහසින්.

නිවන් දකිනා ජාති දක්වා
එකම මව් කුස ඉපදිලා
යලි යලිත් මට හමුවෙයන් නුඹ
මගේ ලොකු නංගිම වෙලා'

-- නිමි --

Publication of the Sinhalese Cultural Forum of NSW - July 2014.